ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල

කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලික ඇස්තමේන්තුව, සත්‍ය ආදායම සමඟ සැසඳීමේදී ආදායම් සංකේත 11 කට අදාළව සියයට 6 ක අඩුවීමක සිට සියයට 1,398 ක වැඩිවීමක් දක්වා පරාසය තුල වෙනස් වී තිබිණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේතාංක 5 කට (රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම-අනෙකුත් කුලී, විකුණුම් හා ගාස්තු-පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්-විවිධ, විකුණුම් හා ගාස්තු-අනෙකුත් ලැබීම්, පොළිය- ණය දීම, ණය ආපසු අයකර ගැනීම) අදාළව හිඟ හිටි ආදායම රු.2,376,435,947 ක් වූ අතර, ඉන් වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම රු.2,230,969,063 ක් වී තිබුණි. තවද, වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම් ශේෂය තුල රු.2,226,572,432 ක් එනම්, සියයට 99.8 ක ශේෂය වසර 3 කට වඩා වැඩි හිඟ හිටි ආදායම් ශේෂ බව තවදුරටත් නිරීක්ෂණය විය.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ	හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඇ)	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායමට සාපේක්ෂව 2024 දෙසැම්බර් 31 දින වන විට සමස්ත හිඟ හිටි ආදායම සියයට 100 අඩුවීමේ සිට සියයට 656 ක වැඩිවීමක් දක්වා වූ පරාසයක විචලනය වී තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	හිඟහිටි ආදායම් අඩුවීම්වලට අදාළව කාර්යක්ෂමව අයකරගැනීමට කටයුතු කළ යුතු වීම.

(ඇ) ආදායම් සංකේත අංක 2003.02.99 යටතේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.540,981 ක හිඟ ආදායම් ශේෂය 2024 දෙසැම්බර් 31 දින වන විට රු.4,087,297 කින් හෙවත් සියයට 656 කින් ඉහළ ගොස් තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	හිඟහිටි ආදායම් කාර්යක්ෂමව අයකරගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඉ) ආදායම් සංකේත අංක 20.06.04.00 ප්‍රාග්ධන ආදායම් - ණය ආපසු අයකර ගැනීම් යටතේ සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සංගමයට අදාළව රු.11,114,479 ක හිඟ හිටි ආදායම් ශේෂයක් සහ ආදායම් සංකේත අංක 20.02.02.01 පොළිය - ණය දීම යටතේ ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට හා සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සංගමයට අදාළව පිළිවෙලින් රු.612,893,552 ක් හා රු.2,814,035 ක් සහ සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් සඳහා වූ රු.296,351,801 ක් වශයෙන් එකතුව රු.912,059,388 ක හිඟ පොළී ආදායමක්ද, 2018 වර්ෂයට පෙර සිට ඉදිරියට එමින් පැවති අතර, මෙම ආදායම අයකර ගැනීම පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතින බවද තවදුරටත් නිරීක්ෂණය විය.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	-එම-

3.2 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පුනරාවර්තන වැය විෂයන් 18 ක් සහ ප්‍රාග්ධන වැය විෂයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුල උපයෝජනය කල පසු රු.63,850,948,140 ක ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 69 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතු වීම.
(ආ) මූලික වියදම් ඇස්තමේන්තුව හා ශුද්ධ ප්‍රතිපාදනය සැසඳීමේදී වැය විෂයන් 16 කට අදාළව විචලතාවය සියයට 100 අඩුවීමේ සිට සියයට 917 ක වැඩිවීම දක්වා පරාසයක් තුල වෙනස්ව තිබුණි.	විචලනයන්ට හේතු පහත පරිදි වේ. • අපේක්ෂා කරන ලද ප්‍රමාණයට වඩා 2024 වර්ෂයේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම.	මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතු වීම.

		• සැලකිය යුතු විදේශ ණය ප්‍රමාණයක් ප්‍රතිව්‍යුහගත කරන ලද අතර, එහිදී එම ණය යටතේ ඒ දක්වා නොගෙවා තිබූ ණය පොලිය ද ප්‍රතිව්‍යුහගත කරන ලද ණය මුදලේ කොටසක් බවට පරිවර්තනය කරන ලදී. එලෙස ප්‍රාග්ධනිත කරන ලද ණය පොලී සඳහා සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. • ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අමතර ප්‍රතිපාදන සලසා ගැනීමට සිදු වීම.	
(ඇ)	සමාලෝචිත වර්ෂයේදී, අංක 249-1-2-0-1409-32 දරන වැය විෂය සඳහා 2024 අගෝස්තු 23 දින බල අංක 2024-2490000-BCUV-00000003 හා 2024 දෙසැම්බර් 24 දින බල අංක 2024- 2490000-BCUV-00000016 දරන මාරු පත්‍ර මඟින් පිළිවෙලින් රු.5,000,000,000 හා රු.4,500,000,000 ක් ලෙස එකතුව රු.9,500,000,000 ක ප්‍රතිපාදන මාරු කර තිබුණි. එසේම, 2024 දෙසැම්බර් 11 දින පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.18,000,000,000 ක් ප්‍රතිපාදන ද සලසා ගෙන තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ ACA 2(ii) - වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය තුළ පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලෙස රු.9,500,000,000 ක් සහ මු.රෙ. 66/69 මාරු කිරීම් යටතේ රු.18,000,000,000 ක් ලෙස වරදවා දක්වා තිබුණි.	මෙම ප්‍රමාද දෝෂයන් නැවත සිදු නොවීමට සටහන් කර ගත් අතර මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.	ප්‍රතිපාදන සලසා ගත් ආකාරය නිසි පරිදි වාර්තා කිරීමට වග බලා ගත යුතු වීම.

3.3 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විදේශ ප්‍රදාන ලැබීම්වලට අදාළ ගිණුම් 10 ක්, තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුම් 02 ක් සහ දේශීය ප්‍රදාන ලැබීම් වලට අදාළ තැන්පතු ගිණුමක් ලෙස එකතුව රු.මිලියන 335 ක් වූ තැන්පත් ගිණුම් 13 ක් සමාලෝචිත වර්ෂය තුළ ගනුදෙනු කිසිවක් නොවී පවත්වාගෙන යන ගොස් තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	ප්‍රදාන, ඒවා ලබා දී ඇති අරමුණට යෙදවීමට කටයුතු කිරීම හෝ එසේ කළ නොහැකි නම් මු.රෙ. 570 අනුව අවස්ථාවෝචිතව අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැරකල යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ණය ලබා ගැනීම් හා ණය ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීම, රජයට විදේශ ණය ආධාර සහ ප්‍රදාන ලෙස ලැබෙන අරමුදල් විධිමත්ව බෙදා හැරීම, දේශීය හා විදේශීය වාණිජ ණය ලබාගැනීමට රජයට අවශ්‍ය පහසුකම් සැලසීම, උප ණය දීමේ වැඩසටහන්වලට අදාළ අරමුදල් ප්‍රවාහ නඩත්තු කිරීම හා රාජ්‍ය ව්‍යවසායන්වලට ණය ලබා ගැනීමේදී අවශ්‍ය භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පැවරී ඇති මූලික වගකීමක් වේ. එසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් එම කාර්යභාරය සාධනීය ලෙස ඉටු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ගිණුම්ගත නොවූ විදේශ ණය රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් අංක 02 (Explanatory Notes) යටතේ 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණය වටිනාකම රු.මිලියන 1,070 ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඒවායේ ප්‍රතිලබ්ධි (disbursements) කාලයන් හි පහත වෙනස්කම් නිරීක්ෂණය විය.	සෑම ණය උපලබ්ධිවීමක්ම මෙම දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කරනු ලබන්නේ අදාල ව්‍යාපෘතිය හා අමාත්‍යාංශය විසින් එම උපලබ්ධිවීම් නිවැරදි බවට තහවුරු කිරීමෙන් පසුව පමණි. කෙසේ වුවද, මෙම උපලබ්ධිවීම් වලට අදාල වියදම නිවැරදි බවට ව්‍යාපෘති කාර්යාලය හා අදාල අමාත්‍යාංශය විසින් සහතික නොකිරීම හේතුවෙන් එයට අනුරූපී ණය මුදල ගිණුම්ගත කිරීමට නොහැකි වි ඇත. කෙසේ වුවද, අදාල ණය මුදල් ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත.	රජයේ ණය ගැනීම් ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම.

ණය අංකය	රජයේ මූල්‍ය ප්‍රකාශනය අනුව ප්‍රතිලබ්ධි වූ කාලය	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වේ තොරතුරු අනුව ප්‍රතිලබ්ධි වූ කාලය
2012017	2020 දෙසැම්බර්	2024
2012025	2023 නොවැම්බර්	2024
2016035	2022 සැප්තැම්බර්	2022 සැප්තැම්බර් 2023 මාර්තු සහ සැප්තැම්බර්

දෙපාර්තමේන්තුව විසින් 2020 සිට 2023 වර්ෂය දක්වා විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව, ඉහත දක්වා ඇති ණය ප්‍රතිලබ්ධි වී තිබූ බව දක්වා නොතිබුණි. ඒ අනුව, එකම ණය ගනුදෙනුවකට අදළව එකිනෙකට පරස්පර තොරතුරු විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ ඒ වගකීම් පැවරූ දෙපාර්තමේන්තු විසින් විදේශ ණය ප්‍රතිලබ්ධිවීම පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන නොමැති බව අනාවරණය විය. තවද, විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුව ද, ඉහත ණය පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වා ගෙන නොතිබුණි. ඒ අනුව, ඉහත විදේශීය ණය ගණුදෙනුවලට අමතරව විධිමත් ලෙස වාර්තා නොවූ වෙනත් විදේශීය ණය පැවතීමේ අවධානමක් පැවතිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ)	පසුගිය වර්ෂයේ සිදු වූ විදේශීය ණය ප්‍රතිලබ්ධිවීම් සමාලෝචිත වර්ෂයේ දී සිදු වූ බවට ණය කළමනාකරණ පද්ධතියේ සටහන් කිරීම හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලබ්ධි වීම් අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.	2023 වර්ෂයේදී වූ ප්‍රතිලබ්ධීන් 2024 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇති අතර එය 2024 වර්ෂයේ ගිණුම්ගත කිරීම මෙම වෙනස්කම් වලට හේතු වී ඇත.	-එම-

ණය අංකය	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව	ණය තොරතුරු පද්ධතිය අනුව ප්‍රතිලබ්ධිවීම්	වෙනස
2012024	USD 947,057	USD 709,147	USD 237,910
2019019	USD 28,717,515	USD 24,938,700	USD 3,778,815
2019043	SAR 47,320,932	SAR 47,284,890	SAR 36,042
2015021	EUR 28,227	නැත	EUR 28,227
2012025	SAR 570,876	SAR 272,171	SAR 298,705

(ඇ)	දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, තැන්පත් ගිණුමේ පැවති රු.මිලියන 14.6 ක් වූ විදේශ ප්‍රදාන අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ආදායමට බැරකර තිබුණි.	තැන්පතු ගිණුමකට අදාළව 2021.10.22 දිනැතිව ලැබී තිබූ රු,1,860,000 ක මුදල එම ව්‍යාපෘතිය 2024 වර්ෂය වන විටත් ක්‍රියාත්මක නොවීම මත අදාළ අමාත්‍යාංශය වෙතින් අවස්ථා කිහිපයකදී විමසීමෙන් පසු හා මුදල් රෙගුලාසි ප්‍රකාරව එම මුදල රජයේ ආදායමට මාරු කර ඇත. ඉතිරි ව්‍යාපෘති 06 ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එක් එක් ව්‍යාපෘතියේ ඉතිරි මුදල් රු.12,752,424 ක් ගිවිසුම් ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.	ප්‍රදායකයන්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණු වලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම.
(ඈ)	2024 ජනවාරි 01 දින වන විටත් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදාන ලෙස ලැබී තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අදාල අරමුණට නොයොදවා අක්‍රියව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු. මිලියන 36.8 ක් විය.	එක් තැන්පතු ගිණුමකට අදාළව රු.15,013,178 ක මුදල සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුව විසින් අදාල දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කල අතර ඒ සඳහා, 2025.04.10 දිනැති ලිපිය මඟින්, තවදුරටත් මුදල් රඳවා ගන්නා ලෙස එම දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. තවත් තැන්පතු ගිණුමක පවතින රු.782,916 ක මුදල 2025 වර්ෂයේදී උපයෝජනය කිරීම සඳහා අදාල අමාත්‍යාංශය විසින් අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ඉල්ලා ඇත. එසේම, ඉතිරි තැන්පතු ගිණුම් 08ට අදාළව පවතින තැන්පතු මුදල් අදාල කාරණයට උපයෝජනය කරගන්නා ලෙස මෙම	-එම-

		දෙපාර්තමේන්තුව විසින් අදාළ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	
(ඉ)	සමාලෝචිත වර්ෂයට පෙර ප්‍රදායකයන් (Donors) 07 දෙනෙකුගෙන් ව්‍යාපෘති 13 කට අදාළව ලැබී තිබූ එකතුව රු.මිලියන 326.6 ක් වූ ප්‍රදාන අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ප්‍රදායකයින් වෙත ආපසු යවා තිබුණි.	ලෝක ආහාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක ඇතැම් වැඩසටහන් වෙත ලැබී තිබූ සම්පූර්ණ මුදලම අදාළ වැඩ සටහන ක්‍රියාත්මක නොවීම හා අනෙකුත් ව්‍යාපෘති /වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එම එක් එක් ව්‍යාපෘතියේ ඉතිරි වූ මුදල් ප්‍රදානකරුගේ ඉල්ලීම, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවය හා අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයේ ඉල්ලීම මත ගිවිසුම් ප්‍රකාරව ප්‍රදායක ආයතනය වෙත ආපසු යැවීමට කටයුතු කර ඇත.	ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස අදාළ කාර්ය සඳහා උපයෝජනය කළ යුතු වීම.
(ඊ)	2024 ජනවාරි 01 දින වන විටත් දේශීය ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.මිලියන 146.5 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ අරමුණට නොයොදවා ඇති බව නිරීක්ෂණය විය.	මෙම දේශීය ප්‍රදාන තැන්පතු මුදල් අදාල කාරණයට උපයෝජනය කරගන්නා ලෙස මෙම දෙපාර්තමේන්තුව විසින් අදාල අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	-එම-
(උ)	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති උපණය (on lending) ශේෂය රු.මිලියන 195,004 ක් වී තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, අදාළ ආයතන උපණය ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ඉක්ම වූ රු.මිලියන 1,304 ක හිඟ උපණය වාරික ශේෂයක් අයකර ගත යුතුව පැවතුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	රජයේ උප ණය, උපණය ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඌ)	2024 දෙසැම්බර් 31 දිනට උපණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම එකතුව රු.මිලියන10,733 ක් වූ අතර, ගිවිසුම ප්‍රකාරව ආයතන 3 ක ට අදාළව වසර 5 ඉක්ම වූ නොගෙවූ පොළී මුදලේ එකතුව රු.මිලියන 912 ක් වී තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	රජයේ උපණය ලබාදීම හා උපණය සේවාවලට අදාළව අයවිය යුතු පොළිය

			ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(එ)	2024 ජනවාරි 01 දිනට ආයතන 04 කට අදාළ උපණය ගිවිසුම් 07 ක් යටතේ පැවති උප ණය ශේෂ එකතුව රු.මිලියන 1,282 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු හිඟ මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	උපණය අයකර ගැනීමට නොහැකි වීම් පිළිබඳ පැහැදිලි කිරීම් පහත පරිදි වේ. • බදුල්ල සණස ආයතනයේ රු.11,114,479 ණය මුදල වාරික වශයෙන් ගෙවීමට පවතින හැකියාව විමසා ඇත. • ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ක්‍රියාත්මක වූ ඉතා පැරණි ණය ගිවිසුම් වන අතර දීර්ඝ කාලයක සිට මෙම ශේෂයන් ක්‍රියාකාරී නොවන මට්ටමේ පවතී. නව ශ්‍රී ලංකා මහ බැංකුව පනත යටතේ මෙම ණය ක්‍රම මහ බැංකුව විසින් මෙහෙයවීමක් සිදු කළ නොහැකි බැවින් මෙම ශේෂ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාරය වෙත පැවරීම සඳහා වාර්ථාවක් ලබා දෙන බව දැනුම් දී ඇත. • තවද, ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ වූ උපණය ගිවිසුම අවසන් වී ඇති අතර රු. 12,826,032 ක මුදල ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ගිණුම් අතර හුවමාරු කර ගැනීමට කටයුතු කරමින් පවතී. • ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියට අදාළ වූ උපණය ශේෂය මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගවේෂණ කටයුතු කිරීමෙන් ලැබෙන දත්ත අලෙවියෙන් ලැබෙන මුදල් මඟින් අදාළ ණය මුදල පියවීමට නියමිතව ඇත.	රජයේ උපණය ලබාදීම හා උපණය සේවා නිසි පරිදි අය කරවා ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ඒ)	2024 වර්ෂය තුළ හා ඊට පෙර කල් ඉකුත් වීම මත රු.මිලියන 143,094 ක සහ එකතුව ඇ.ඩො. 2,678.29 ක වටිනාකමින් යුතු භාණ්ඩාගාර ඇපකර 25 කට හා රු. මිලියන 32,550 ක හා ඇ.ඩො. 210 ක වටිනාකමින් යුතු සහන ලිපි 15 කට අදාළ වලංගු කාලය 2024 දෙසැම්බර් 31 දින වන විට නැවත දීර්ඝ කර තිබුණි. මේ සඳහා අදාළ ණය මුදල් නිසි පරිදි ගෙවීමට අදාළ ආයතනවලට නොහැකිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.	2024 දෙසැම්බර් 31 වන විට නැවත දීර්ඝ කරන ලද සහන ලිපි ප්‍රමාණය 15 කි.	ඉදිරියේදී භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි ලබා දීමේදී නිසි අධීක්ෂණයක් යටතේ ලබා දීමට කටයුතු කළ යුතු වීම.
(ඔ)	සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 11 ක දී නිකුත් කළ රු.මිලියන 102,474.21 ක්, ඇ.ඩො. මිලියන 2,824.31 ක් සහ යූරෝ 12.29 මිලියනයක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 17 ක දී නිකුත් කළ එකතුව රු.මිලියන 33,430 ක් සහ ඇ.ඩො. 210 ක් වටිනා සහන ලිපි 2024 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වු අතර, අදාළ වලංගු කාලය ඉක්මවීමට පෙර විධිමත් පරිදි අවසන් කිරීමට හෝ වලංගු කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	අදාළ භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි වලට අදාළ වලංගු කාලය 2024 දෙසැම්බර් 31 දින වන විටත් දීර්ඝ කිරීමට කටයුතු නොකිරීම පිළිබඳව වර්තමාන තත්ත්වය පැහැදිලි කර නිරීක්ෂණය පිළිගෙන ඇත.	-එම-
(ඕ)	2024 හෝ ඊට පෙර වර්ෂවල ලබා දුන් භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි වෙනුවෙන් දෙපාර්තමේන්තුව අවස්ථා 7 කට අදාළව ණය වාරික වශයෙන් රු.මිලියන 92 ක් හා ණය පොළිය ලෙස රු.මිලියන1,741 ක් වශයෙන් මුළු එකතුව රු.මිලියන 1,832 ක් අදාළ ආයතනයන්ට 2020 වර්ෂය තුළදී ගෙවා තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	-එම-
(ක)	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය රෝහල ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා එම විශ්ව විද්‍යාලය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් ණය මුදලින් 2024 මාර්තු මාසයට අදාළව හිඟව පැවති ණය වාරිකය හා පොළිය පියවීම සඳහා රු. මිලියන 2,200 ක්ද, සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් ලංකා බැංකුව සහ මහජන බැංකුව	අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ගෙවිය යුතු ණය සහ ණය පොළිය සඳහා රු. මිලියන 2,400 ක් ගෙවීම් සිදු කර ඇති අතර ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත	-එම-

වෙත ගෙවිය යුතුව පැවති හිඟ ණය සහ පොළිය ගෙවීම සඳහා ඇ.ඩො. මිලියන 8 කට සමාන රු. මිලියන 2,400 ක් ද දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම හේතුවෙන් එකතුව රු.මිලියන 4,600 ක මුදලක් හිඟ ණය හා පොළී ශේෂයන් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයට දැරීමට සිදුව තිබුණි.	ගෙවිය යුතු ණය සහ ණය පොළිය සඳහා රු. මිලියන 2,200 ක් ගෙවීම් සිදු කර ඇත.	

4.2 දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජනවාරි 01 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 240 ක් හෙවත් රු.මිලියන 77,742 ක් වූ ලංකා බැංකුවෙන් ලබා ගෙන තිබූ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) ණය මුදල හිඟ හිටි පොළිය රු.මිලියන 6,601 ක් ද සහිතව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර වලට පරිවර්තනය කර තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට එම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ලංකා බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 82,551 ක් වී තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(ආ)	ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත රාජ්‍ය වාණිජ බැංකු දෙකකින් ලබා ගෙන, පසුව 2022 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයට පවරාගත් ණය මුදලට අදාළව, 2024 ජනවාරි 01 දිනට පැවති ඇමරිකානු ඩොලර් මිලියන 2,435 ක් හෙවත් රු.මිලියන 788,682 ක ශේෂය පහත පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණි. • ලංකා බැංකුවට ගෙවිය යුතු ණය වටිනාකම වූ රු.මිලියන 410,430 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය රු.මිලියන 73,603 ක් ද ඇතුළුව ඇමරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	-එම-

- මහජන බැංකුවට ගෙවිය යුතු ණය මුදලෙන් රු.මිලියන 136,698 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය රු.මිලියන 30,464 ක් ද ඇතුළුව ඇමෙරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර, ඉතිරිය රු.මිලියන 224,358 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය වන රු.මිලියන 38,225 ක් ද ඇතුළුව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.

- එම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 1,582 ක් හෙවත් රු.මිලියන 462,783 ද, මහජන බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 546 ක් හෙවත් රු. මිලියන 159,823 ක් ද මහජන බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 262,583 ක් ද වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුරු 07 ක්ද, ද්වීතියික මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ තනතුරු 14 ක් ද ඇතුළුව මුළු පුරප්පාඩු 28 ක් පැවතුණි. තවද, ද්වීතික මට්ටමේ සංවර්ධන නිලධාරි සේවයේ එක් තනතුරක් අතිරික්තව පැවතුණි. කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර පවතින පුරප්පාඩු පිරවීමට හෝ අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	තනතුරුවල පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පුරප්පාඩු තනතුරුවලට අදාලව පත්වීම් බලධාරීන් වෙත මුදල් අමාත්‍යාංශ ලේකම් මගින් ලිඛිතව ඉල්ලීම් කළද රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස බඳවා ගැනීම් සීමා කිරීම හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2022 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව නිලධාරීන් දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම නිසා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත.	දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමටත්, අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වීම.